# රබර් සමග මිශ්‍ර භෝග වගාවේදී සුදුමුල් රෝගය හොඳින් පාලනය කිරීමේ වැදගත්කම්

කේ.ඊ. ජයසූරිය සහ ඕ. එස්. වෙත්තසිංහ

සුදුමුල් රෝගය ශ්‍රී ලංකාව ඇතුලුව රබර් වවන ලෝකයේ බොහෝ රටවල *රිජිඩොපෝරස් මයික්‍රොපොරස්* නම්වූ දිලීරය නිසා රබර් ශාකයට හටගන්නා මුල් රෝගයකි. මෙම රෝගය නිසා මේරූ හා නොමේරූ රබර් ගස් විනාශ වී යන අතර යාබද නිරෝගී ගස්ද සුලු කලකදී විනාශ වේ. මුල් අවස්ථාවේදී දිලීරය, උඩු පසේ ඇති මුල් පද්ධතියේ දැකිය හැකි අතර පසුව පොත්ත ඇතුලතින් වර්ධනය වීම හේතුවෙන් පත්‍ර මැලවීම, යට අතට හැකිලීම සහ කහපාට වීම යන රෝග ලක්ෂණ පෙන්වයි. පසු කලකදී, පොලවට යාබද කඳ වටේට ඇති පොත්තෙහි පටක සම්පූර්ණයෙන්ම ආසාදනය වීම නිසා ශාකය මියයයි. දිලීරය මුල ප්‍රදේශයේ අධික ලෙස වර්ධනය වීම හඳුනා ගැනීමට ශාකයෙහි කර කොටසෙහි පස්තට්ටුව ඉවත්කර නිරීක්ෂණය කල හැකි අතර, පසු අවධියේදී පිරිසි හැඩැති තැඹිලි දුඹුරු වර්ණ ඝණ හතු (බිම්මල්) මගින්ද ලෙහෙසියෙන් හඳුනාගත හැක. දිගටම පවතින වර්ෂා කාලයන්හිදී දිලීරය පස් මට්ටමෙන් ඉහලටද වර්ධනය වන අයුරු නිරීක්ෂණය කල හැක. අනෙකුත් ක්ෂුද්‍රජීවීන් මෙන්ම මෙම දිලීරයද මතුපිට පසෙහි වර්ධනය වීමට වඩා කැමැත්තක් දක්වන අතර ආවරණ වගා යට කාබනික ද්‍රව්‍ය වලින් ගහණ පස් ඇති නිසා මෙම දිලීරය මනාව වර්ධනය වෙමින් යාබද නිරෝගී ගස් වලට රෝගය ඉක්මනින් බෝවේ. තෙත් ප්‍රදේශ වල දිලීරය හොඳින් වැඩෙන නිසා ඉක්මනින්ම රෝගී ශාකය මැරී යයි.

සාමාන්‍යයෙන් රබර් වගාවක් ආර්ථික වශයෙන් වඩා වාසිදායක ලෙස පවත්වාගෙන යාමට ගස්වල නිරෝගී වර්ධනය, පොහොර යෙදීම හා පාංශු ඛාදනය වැලැක්වීමේ ක්‍රම යනාදි වගා කළමනාකාරීව නිර්දේශයන් පිලිපැදිය යුතුවේ. පසුගිය ශතවර්ෂ දෙක තුලදී ශ්‍රී ලංකාවේ රබර් වගාවන් තුල සුදුමුල් රෝගය සැලකිය යුතු අන්දමින් පැතිරී ගිය අතර නිශ්පාදනය අඩුවී ආර්ථික වශයෙන් අවාසිදායක වගාවක් බවට පත්විය.

මෑතදී කරන ලද කෙටි සමීක්ෂණයකට අනුව තැනිතලා ඉඩමක සුදුමුල් රෝගයට පාත්‍රවූ තනි රබර් ගසකින් අවුරුදු 15 ක කාලසීමාවකදී සාමාන්‍යයෙන් ගස් 55 සිට 80 දක්වා විනාශවී යන බව හෙලිවී ඇත. කෙසේ වෙතත් මෙම ගණන 80-135 දක්වාද වැඩි වීමට හැකි අතර එයට බලපාන සාධක වන්නේ රෝගය මුලින් ඇතිවූ ගස් ගනන සහ ඒවායේ පිහිටීම පේලියක මැද හෝ නැතිනම් පාරක් මායිමේද යන කරුණුය. කෙසේ වෙතත් බෑවුම් සහිත ඉඩම් වලදී සුදුමුල් රෝගය වැළඳුන ගසකින් එකම පේලියේ පිහිටි දෙපැත්තේ ගස් දෙකට සහ පහත මට්ටම් වල ගස් වලටද ලෙහෙසියෙන් බෝවේ. අංශක 20 සිට 30 දක්වා බෑවුම සහිත ඉඩමක අවුරුදු 15 ක කාලසීමාවකදී තනි රෝගී ගසකින් තවත් ගස් 20 කට පමන රෝගය බෝවීමේ ප්‍රවනතාවක් ඇති බව සොයාගෙන ඇති අතර ඉහතදී විස්තර කරන ලද සාධක හේතු කොට ගෙන මෙම ගණන 30 දක්වා වැඩිවීමටද හැකියාව තිබේ (ප්‍රකාශිත නොවූ ශාක ව්‍යාධි විද්‍යා හා ක්ෂුද්‍රජීවී විද්‍යා දෙපාර්තමේන්තුවේ දත්ත අනුව). මේ අනුව සුදුමුල් රෝගයේ ප්‍රචාරණය සලකා බැලීමේදී රබර් සමග වෙනත් අතුරු භෝගයක් වගා කිරීමේදී රෝගය වඩා වැඩි වේගයකින් පැතිරිය හැක. මෙම ලිපියෙහි රබර් සහ අතුරු බෝග වගාවේ ආරම්භයේදී සුදුමුල් රෝගයේ පාලනය කිරීමේ වැදගත්කම ගැන සහ එසේ නොකිරීමෙන් සිදුවන අවාසි සහ ගැටලු ගැන විස්තර දක්වයි.

රබර් වගාවක අතුරුබෝග වැවීමෙන් ලබන ප්‍රතිලාභ

අතුරුබෝග වගා ක්‍රම කෘෂිකර්මාන්තයේ තිරසාර භාවය වැඩි කරන ශිල්පීය ක්‍රමයකි. එයින් බිම් පරිභෝජනය උපරිම වන අතර උපරිම ආර්ථික ප්‍රතිලාභද ලැබේ. අතුරුබෝග වගා කිරීමෙන් ඒකක බිම් වපසරියකින් ලැබෙන ආදායම වැඩිවනවා පමණක් නොව ඒවායේ පස්වල ගති ලක්ෂණද දියුනු වේ. මීට අමතරව වල් පැලෑටි වර්ධනය අඩුවන අතර රෝග සහ පලිබෝධ හානි ද අඩුවිය හැකිය. රබර් වගාවක සිටවා ඇති ක්ලෝන වර්ගය අනුව එම වගාවේ නොමේරූ කාලය වසර 6-7 ක් පමණ වන අතර මෙම කාලය තුල ලබාගත හැකි ආදායම වැඩිකර ගැනීමට අතුරුබෝග වගා කිරීම නිර්දේශ කෙරේ. වාර්ෂික වර්ෂාපතනය ඉහල මට්ටමක ඇති මධ්‍යම හෝ පහත රට කලාප වල අතුරුබෝග වගාව සාර්ථකව කරගෙන යාහැකි හිතකර පාරිසරික තත්වයන් ඇත. ස්ථිර අතුරුබෝග සහිත වගාවක අක්කරයකට ඇති රබර් පැල ප්‍රමානය, රබර් පමනක් සිටවූ වගාවක ප්‍රමාණයට වඩා අඩුය. කෙසේවෙතත් තේ, කුරුඳු හෝ වෙනත් ස්ථිර ශාක බෝගයක් රබර් සමග මිශ්‍ර භෝගයක් ලෙස වැවීමෙන් දිගු කලක් අඛන්ඩව වැඩි ආදායමක් උපයා ගත හැකිය.

ශාක වර්ධනය, ආලෝකය හොඳින් ලැබීම සහ තෙතතමනය පැවතීම යන කරුනු නිසා අතුරු භෝග වගාවේ රබර් ශාක වල, ඒක භෝග වගාවක රබර් ශාක වලට වඩා සරු වැඩීමක් දැකිය හැකි අතර වැඩි ඵලදාවක්ද බලාපොරොත්තු විය හැක. මෙම දත්තයන් සහ නිරීක්ෂණ සමාලෝචනය විය යුතු අතර නිගමනයකට පැමිණීමට වැඩිදුර පර්යේෂණ කල යුතුව ඇත. මීට අමතරව පළමු වසර 3-4 දී සමහර තේ වර්ග දීර්ඝ කාලීන ඉඩෝර වලදී විශාල ප්‍රමානයක් මැරී යයි. එනමුත් අතුරු භෝගයක් ලෙස වගා කරන ලද තේ වගාවක් තද ඉඩෝර වලදී හානි නොවී පවතී. වෙනත් ආකාරයකින් අර්ථ දක්වන්නේ නම් විවිධ භෝග වර්ග එකම බිමක සිටුවීම බහුභෝග වගාව වශයෙන් හඳුන්වන අතර මෙමගින් පසෙහි සංයුතිය සහ පෝෂක ද්‍රව්‍ය වල තත්වය සහ හිතකාමී ක්ෂුද්‍රජීවී ගහණයන් වැඩිවීම නිසා ප්‍රධාන වගාවේ ගස් වලට ඉතා යෝග්‍ය වේ.

සාමාන්‍යයෙන් රබර් සහ තේ අතුරු බෝග වගාවක් ලෙස ස්ථාපනය කලවිට, මුල් අතර තරගකාරීත්වය හෝ තේ වලට යොදන රසායනික පොහොර හේතුවෙන් තේ සහ රබර් අතර හොඳින් මුල් එකතු වීමක් දැකිය හැක. එනිසා රබර් ජේලි දිගේ රෝගයක් ඉක්මනින් ප්‍රචාරණය වීමට මෙය එක් හේතුවක් විය හැකිය. එනිසා විශේෂයෙන්, අතුරුභෝග වගාවක සුදුමුල් රෝගය තිබේ නම් ඉක්මනින් ප්‍රතිකාර කිරීම අත්‍යාවශ්‍ය කරුණකි. රෝගය නොසලකා සිටීමෙන් භෝග දෙකම ඉක්මනින් විනාශවී යාහැක.

ළපටි අවධියේදී රබර් ගස් රෝගය වැළඳී ඉතා කෙටි කලකදී මිය යාමට හැකි අතර තේ ගසද සුදුමුල් රෝගයට පාත්‍රවීම සිදුවේ. කෙසේ වෙතත්, මේරූ තේ පඳුරු සුදුමුල් රෝගයට සැලකිය යුතු කාලයක් ප්‍රතිරෝධී වන අතර පාර්ශ්වික මුල් මාර්ගයෙන් යාබද පඳුරු වලට රෝගය පහසුවෙන් පැතිරේ. රෝගය කඳ මුලෙහි සිට පැතිරී යන්නේ පාර්ශ්වික මුල් වලින් බව බොහෝ අවස්ථාවලදී සඳහන්වී තිබේ. මේ අයුරින් බලන කල තේ පඳුරු ආශ්‍රයේ ඇති දිරා යන කොල රොඩු තට්ටුව අතරින් ගමන් ගන්නා දිලීර සූත්‍රිකා මගිනුත් යාබද තේ පඳුරු ආසාධනය විය හැකි යැයි පිලිගැනීමට සිදුවේ. අතුරුභෝගයක් ලෙස තේ පඳුරු සිටුවා ඇත්තේ සෙ.මී. 120 × 60 (අඩි 4 × 2) දුර ප්‍රමාණයකින් බැවින්, මෙම රෝග කාරකයාට වගාව ඇතුලත රබර් ජේලියකින් වෙනත් ජේලියකටත් ගමන් කලහැකි අන්දමේ දිලීර ජාලයක් සෑදීමේ හැකියාව ඇත. එමනිසා මෙම රෝගය රබර් වල හෝ තේ වලට වැළඳී ඇත්නම් ඉක්මනින්ම ඒ

සඳහා ක්‍රියාත්මක විය යුතුයි. තේ මුල්වල රෝගය නිරායාසයෙන් හඳුනාගැනීම අපහසු නමුත් සුදුමුල් රෝගය රබර් වගාවන්හි වැළඳෙන ආකාරය පිළිබඳ මූලික දැනුමක් වගා කරුවාට තිබිය යුතුයි. රබර් වගාකරුවන් තමාගේ රබර් වගා වල විස්තර සටහන් කර තැබීමේදී ඔවුන් විසින් රබර් පැල වගා කර ඇති ආකාරය දක්වන සිතියමේ තබා ගත යුතු අතර මෙම සිතියම් වල සුදුමුල් රෝගය ඇති ස්ථාන ලකුණු කර තබාගත යුතුය. එයින් මීලග වගාව නිරෝගිව තබාගැනීම පහසුවේ. සුදුමුල් රෝගය පැතිරුණු රබර් වගා වල අනුමත කර ඇති තාක්ෂණ ක්‍රමයන් අනුගමනය කිරීම වැදගත් වන අතර, මෙම උපදෙස් අනුගමනය කර තිබුනේ නම් මෙවැනි කරදරකාරී තත්වයන්ට මුහුණ පෑමට සිදුනොවේ. එමෙන්ම සුදුමුල් රෝගයට පාත්‍රවූ රබර් වගාවක් තිබුණ බිමක තේ වගා කිරීමට අවශ්‍ය නම්, අලුතින් මෙම ඉඩමේ වවන තේ පැල ගැන සුපරීක්ෂාකාරීව සිටීම පහසු නොවේ. මේ නිසා රෝගයට පාත්‍රවිය හැකි පළවෙනි වසර දෙක තුලදී ඉහත සඳහන් කල කලින් වගාවේ රෝගය තිබූ ස්ථාන වල සිටුවන ලද තේ සහ රබර් පැල ගැන නිරන්තරව පරීක්ෂාකාරී විය යුතුය. එමෙන්ම දිලීරය මර්ධනය කිරීම සඳහා පසට ගෙන්දගම් කලවම් කිරීම කල හැකිය. මේ සඳහා ගෙන්දගම් කුඩු රබර් ගස් අතරට කලවම් කලයුතු අතර ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනය අනුමත කරන්නේ නම් තේ පඳුරු අතරටද කලවම් කල හැක. ගසට උරාගන්නා දිලීර නාශකයක් යෙදීම තේ පැල සඳහා යෝග්‍ය නොවිය හැකි නමුත් සුදුමුල් රෝගය පාලනය කිරීම සඳහා රෝගය බෝවී ඇති තේ පඳුරු වලට හෙක්සකොනසෝල් යෙදීම ප්‍රතිඵලදායක විය හැකිය (තේ පර්යේෂණායතනයේ අදහසක්).

සුදුමුල් රෝගය නියම වේලාවට නියම ආකාරයෙන් පාලනය නොකලහොත් රෝගය වඩා වේගවත්ව බෝවීම පාලනය කිරීමට වඩා වැඩි වියදමක් දැරීමට සිදුවනු ඇත. නැතහොත් රෝගය තේ ගස් වලින් රබර් ගස් වලටද රබර් ගස් වලින් තේ පඳුරු වලට බෝවීමද සිදුවේ.

සුදුමුල් රෝගය ප්‍රචාරණය වීමේ වේගය සංසන්දනය කිරීමේ අරමුණෙන් අපගේ තේ සහ රබර් මිශ්‍ර භෝග ලෙස වගා කර ඇති අවුරුදු 14 ක් වැඩුනු ක්ෂේත්‍රයක එම කාල පරිච්ඡේදයේදී රෝගය ව්‍යාප්ත වීම සටහන් කරන ලදි. මෙම වගාව පිහිටා ඇති භූමියෙහි කලින් තිබුණ රබර් වගාව සුදුමුල් රෝගයට පාත්‍රවී තිබුනු බව වාර්තා වේ. පර්යේෂණ සඳහා වෙන්කල වගා බිම් කොටස් 24 ක් මෙහි ඇති අතර මේවායින් 9 කම සුදුමුල් රෝගය නිරීක්ෂණය කරන ලදි. රබර් තනි පේලි ආකාරයට සිටුවා තිබුන අතර අතුරු භෝග ලෙස වගා කර තිබුණ කොටස් වල ගස් අතර පරතරය අඩි $8 \times 27$ හෝ අඩි $8 \times 40$ වන අතර රබර් පමණක් වගාකර ඇති බිම් වල රබර් අතර පරතරය අඩි $12 \times 8$ වේ. තේ පඳුරු වගා කර ඇත්තේ අඩි $2 \times 4$ වන අතර රබර් පේලියේ සිට තේ පේලියට අඩි 8 කි.

අතුරු භෝග වගාවේ මුලු බිම් ප්‍රමාණය හෙක්ටයාර 1.25 ක් වූ අතර මෙහිදී සුදුමුල් රෝග සහිත කලාප 19ක් හමුවිය. බොහෝ රෝගී ගස් සහිත කලාප වල තේ ගස් පේලි 2 ක් වෙත රෝගය ව්‍යාප්ත වී තිබුනු අතර සමහර කලාප වල තේ පේලි 5 ක් දක්වා ව්‍යාප්තවී තිබිණ. වගාවේ තැන් තැන් වල ඇති මෙම රෝගී කලාපවල රබර් ගස් වලට ප්‍රතිකාර කලද සැලකිය යුතු ප්‍රමාණයක් රෝගය නිසා මැරී ගොස් ඇත. මෙයට හේතුව වශයෙන් දැකිය හැකි වන්නේ මුල් පද්ධතිය අන්තර්ජාලයක් ලෙස සම්බන්ධව පවතින නිසාය.

මෙම පර්යේෂණ වගාවේ රබර් පමණක් වගා කරන ලද වගා බිම් කොටස් අතරේ රෝගය ඉතා අඩු බව නිරීක්ෂණය කර ඇති අතර මෙයින් අතුරු භෝග වගාවෙදී ඉක්මනින් රෝග බෝවීමේ ප්‍රවනතාව

පැහැදිලි වේ. රෝගය ප්‍රචාරණය වීම සඳහා තේ ප්‍රධාන වශයෙන් දායක වී ඇත. කෙසේ වෙතත් සැලකිය යුතු තේ පඳුරු ප්‍රමාණයක් කිරිවේයාගේ (Live Wood Termite) (තේ ගසේ අමු ලිය කමින් ජිවත්වන වේයන් වර්ගයකි) හානිය නිසා හෝ වෙනත් හේතු මගින්ද මැරී ඇති බව හමුවිය.

කිරිවේයාගෙන් හෝ වෙනත් හේතු නිසා තේ පමණක් වගා කරන ලද කොටුවල 24.2% ක ප්‍රතිශතයක් විනාශ වී තිබුණ අතර, තේ රබර් අතුරු භෝග වගාවල එම අගය 32.7% ක ප්‍රතිශතයක් විය. තේ පමණක් වගාකල භූමි වල සුදුමුල් රෝගය නිසා මැරිගිය තේ පඳුරු වල ප්‍රතිශතය 0.1-27% කි. තේ සහ රබර් අතුරු භෝග වගා බිම් වල 25.6% ට ආසන්න තේ පඳුරු ප්‍රමාණයක් සුදුමුල් රෝගය නිසා මැරී ගොස් තිබුණි. තේ පමණක් ඇති ප්‍රදේශයේ විනාශ වී ඇති ප්‍රතිශතයට (37%) වඩා වැඩි අගයක් (57.6%) මිශ්‍ර භෝග වගාවේ ඇති බව පැහැදිලි විය. මෙයට හේතුව භෝග දෙක වගා කරන ක්‍රමයන්හි දක්වන සංකලන බලපෑම සහ භෝග දෙකේම මුල පද්ධතියේ ජෛව භාරය ඉහල අගයක් දැක්වීමයි. එමනිසා අවුරුදු 14 ක් තුලදී මෙම මුල් රෝගය නිසා හානි වූ තේ වගා කල බිම් ප්‍රමාණය හෙක්ටයාර 0.14 ක් විය හැකි අතර මිශ්‍ර භෝග වගාව තුල හානිවූ රබර් වගා කළ බිම් ප්‍රමාණය හෙක්ටයාර 0.24 ක් විය.

රබර් පමනක් වගා කල බිම් වල රෝගයට හසුවූ බිම් ප්‍රමාණය හෙක්ටයාර 0.0143 වන අතර මිශ්‍ර භෝග ලෙස වගා වල රෝගයට පාත්‍රවූ රබර් වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 0.244 කි. රෝගයට හසුවූ මුලු රබර් සහ තේ බිම් ප්‍රමාණය හෙක්ටයාර 0.4 ප්‍රමාණයකි. කෙසේ වෙතත් මෙම බිම් ප්‍රමාණය අතිරේක 5% ක පමණ ප්‍රතිශතයකින් වැඩිවීමට ඉඩ ඇත. ඒ, අර්ධ වශයෙන් රෝගය බෝවූ තේ පඳුරු නිරීක්ෂණය නොවී තිබිය හැකි වීමයි. එමනිසා රෝගයට පාත්‍රවූ මුලු බිම් ප්‍රමාණය හෙක්ටයාර 0.42 ක් පමණ වියයුතු වන අතර එය වගාවේ මුලු බිම් ප්‍රමාණයෙන් 34% ක් වේ. එමනිසා මෙම රෝගය නිසා මෙහි පෙන්වන ආර්ථික හානිය සලකා බැලිමේදී මෙම පාඨාංකයන් ඉතා ඉහළ අගයක් දක්වයි.

කුරුඳු ශාකයද සුදුමුල් රෝග කාරක දිලීරය සඳහා හොඳ ධාරක ශාකයක් ලෙස වාර්තාගත වී නැතත්, රබර් සමග අතුරුබෝග ලෙස වැවූ විට සුදුමුල් රෝගයට පාත්‍රවී ඇත. කෙසේ වෙතත් කුරුඳු වලට දිගු කලක් මෙම රෝගයට ඔරොත්තු දීමේ හැකියාව ඇත. ඒ කුරුඳු මුල් වල පොතු වල කපුරු, සිනමැල්ඩිහයිඩ්, ඉයුජිනෝල් වැනි දිලිරනාශක පිනොලික ද්‍රව්‍යයන් අන්තර්ගත නිසාය. නමුත් ඒවායේ මුල් මාර්ගයෙන් දිලිරය ආශ්‍රිත පඳුරු වලට පහසුවෙන් හුවමාරුවේ. කෙසේ වෙතත් තේ පඳුරු වලදී තරම් වේගයෙන් කුරුඳු වල මුල් හරහා දිලිරය ප්‍රචාරනය නොවන බවට නිරීක්ෂණය කර ඇත.

කොකෝවා ශාකයද රබර් සමග අතුරුබෝග වගා කල හැකි බහුවාර්ෂික භෝගයකි. අතුරුබෝග වගා ඉඩම් වල ශාක ගහණය වැඩි නිසා මෙම දිලිරයේ වර්ධනය සඳහා අවශ්‍යතා හොඳින් සපුරාලන අතර රෝගය ප්‍රචාරණය උපරිම වේගයකින් සිදුවේ.

ක්ෂේත්‍රයේදී ලබාගත් මෙම දත්තයන් අනුව අතුරුබෝග වගා කිරිමේදී සුදුමුල් රෝගය ගැන වඩා සුපරික්ෂාකාරී විය යුතු බව අවධාරනය කෙරේ. එහෙත් රබර් වගාවෙහි අතුරුබෝග වගාව ලාභදායි නොවන බවක් හෝ සුදුමුල් රෝගය වැඩිවන බවක් හෝ මෙයින් අදහස් නොකෙරේ. කෙසේ වෙතත් මෙම ලිපිය මගින් අවධාරණය කර ඇත්තේ සුදුමුල් රෝගය හඳුනාගත් මුල්ම අවස්ථාවේදිම පාලනය කිරීමෙන් පසු කාලයේදී මුහුණපාන විශාල ගැටලු මගහරවා ගැනිම අත්‍යාවශ්‍ය බවය. රෝගය වැළඳුන ගසක් හෝ ගස් කිහිපයක් ප්‍රතිකාර කිරිම සඳහා කම්කරුවන් 5 ක් හෝ 10 ක් යෙදිම, පසු කාලයේදී ගස් මැරී යාමෙන් වන හානිය හා සසැඳිමේදී වඩා ලාභදායකය. මෙම සුදුමුල් රෝගය පාලනය කිරිම සඳහා රබර්

වගාවේ වයස ප්‍රමාණය අනුව හෙක්සකොනසෝල් (කොන්ටැෆ් හෝ ෆොලිකර්) (0.05-0.1% සාන්ද්‍රනයෙන්) ලිටර 1 ගස දිගේ වටේ වත්කිරීම යෝග්‍යය. එසේම තේ හෝ කුරුඳු වගාව සඳහාද ඒ සමානවම ප්‍රතිකාර කිරීම තේ පර්යේෂණායතනය හෝ අපනයන කෘෂිකර්ම භෝග දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කිරීමෙන් කළ හැක. දිලීර නාශකය රබර් ගස් වලට යෙදීමේදී ගස වටේ පස්වලට මඳක් ඉහල ප්‍රදේශයේ මැරුනු පොතු කොටස් ප්‍රවේසමෙන් සුරා ඉවත් කිරීමෙන් දිලීරය ගසට උරාගැනීම පහසු කළ හැකිය. ප්‍රතිකාර වලින් පසුව වරින්වර ගසෙහි පාදස්ථය වටේම රෝගය ඇති නැතිබව පරීක්ෂා කිරීම හොඳ ප්‍රතිඵල සඳහා වඩා යෝග්‍ය වේ.

**ස්තුතිය**

මෙම ලිපිය සැකසීමේදී යෝජනා ඉදිරිපත් කිරීම පිළිබඳව ශ්‍රී ලංකා තේ පර්යේෂණායතනයේ ව්‍යාධි විද්‍යාඥ ආචාර්ය ඒ. බාලසූරිය මහතාටද, පරිඝනක ආශ්‍රිත සිංහල යතුරු ලියන කටයුතු සඳහා ප්‍රියානි අමරසේකර මහත්මියටද ස්තුති ප්‍රණාමය හිමිවේ.